නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 ஆம் மாடி, செத்சிறிபாய, பத்தரமுல்ல.
4 floor, Sethsiripaya, Battaramulla.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No: DDD/HO/15/SW/03/01
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2015.03.25

දිවිනැගුම සහනාධාර චක්‍රලේඛ අංක

දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් භාර දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

**2015 අතුරු අයවැය යෝජනාව අනුව දිවිනැගුම සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම.**

2015 අතුරු අයවැය යෝජනා පදනම් කරගනිමින් සමෘද්ධි දීමනාව 2015 අප්‍රේල් මස සිට 200%න් වැඩි කිරීමට කටයුතු යොදා ඇත.

**02.** ඒ අනුව 2014 දෙසැම්බර් මස ලැබූ සහනාධාර වටිනාකම් පදනම් කර ගනිමින් සමෘද්ධි සහනාධාරය 2015 අප්‍රේල් මස සිට 200%න් වැඩිකරනු ලබන අතර, දැනට සහනාධාර ලබමින් සිටින ප්‍රතිලාභීන් සඳහා නව දීමනා වර්ග 04ක් හඳුන්වා දෙනු ලැබේ. මෙම වැඩිවන නව දීමනා වර්ග 04 සඳහා සහනාධාර දීමනා පහත සඳහන් අයුරින් ලබා දීමට කටයුතු කළ යුතුය.

| පවුලේ සාමාජික සංඛ්‍යාව | දැනට පවතින සහනාධාර වටිනාකම රු. | නව සහනාධාර වටිනාකම රු. | සහනාධාර දීමනාව බෙදීයන ආකාරය | | | |
|---|---|---|---|---|---|---|
| | | | අනිවාර්ය ඉතිරි කිරීම් රු. | සමාජ ආරක්ෂණය රු. | නිවාස ලොතරැයිය රු. | ප්‍රතිලාභියාට ගෙවිය යුතු මුදල රු. |
| 04 හෝ 04ට වැඩි | 3000/= | 4500/= | 300/= | 75/= | 10/= | 4115/= |
| 03 | 2000/= | 3600/= | 200/= | 75/= | 10/= | 3315/= |
| 03ට අඩු | 1000/= | 2250/= | 100/= | 75/= | 10/= | 2065/= |
| සවිබල ගැන්වූ පවුල් | 420/= | 630/= | 545/= | 75/= | 10/= | - |

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2872202 | 011-2861994 | 011-2873799 | 011-2889046 |
| ෆැක්ස්/ தொலைமடல்/Fax: | 011-2889002 | | 011-2873996 | |
| ඊ-මේල්/ மின்னஞ்சல்/ E-Mail: | dgdivineguma@gmail.com | anuradhakum@yahoo.com | hrddivineguma@gmail.com | |

2.1 මෙම සහනාධාර වැඩසටහන යටතේ පෙර පරිදිම සමාජ ආරක්ෂණය, අනිවාර්ය ඉතුරුම්, නිවාස ලොතරැයි අරමුදල සඳහා මුදල් වෙන් කරන අතර, ඒ අනුව පහත උපදෙස් පිළිපැදිය යුතු වේ

| | | | |
|---|---|---|---|
| I. | සමාජ ආරක්ෂණය සඳහා | - | සමාජ ආරක්ෂණ අරමුදල මගින් සෑම මසකම 10 දිනට දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලය මගින් ප්‍රේෂණය කරනු ලැබේ. |
| II | නිවාස ලොතරැයිය සඳහා | - | සමාජ ආරක්ෂණ අරමුදල මගින් සෑම මසකම 10 දිනට දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලය මගින් ප්‍රේෂණය කරනු ලැබේ. |
| III | අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා | - | වගුවේ දක්වා ඇති ආකාරයට සෑම මසකටම අදාළ අනිවාර්ය ඉතිරි කිරීම් හා ප්‍රතිලාභියාට ගෙවිය යුතු මුදල එකවර ගිණුමට ගිණුම්ගත කළ යුතු අතර, ප්‍රතිලාභියාට මුදල් ගෙවීමේදී අනිවාර්ය ඉතුරුව ලෙස සඳහන් මුදල රඳවාගෙන ඉතිරිය ගෙවීමට අවශ්‍ය විධිවිධාන සැළසිය යුතුයි. |
| IV | ප්‍රතිලාභියාට ගෙවිය යුතු මුදල | - | ඉහත (III) හි පරිදි ගිණුම්ගත කළ පසු (අනිවාර්ය ඉතුරුම් මුදල හැර) මෙම මුදල ප්‍රතිලාභියාට ඕනෑම අවස්ථාවක ලබා ගත හැකිය. (මෙම මුදල් ගෙවීම සම්බන්ධයෙන් කිසිදු කොන්දේසියක් ප්‍රතිලාභීන් වෙත නිකුත් නො කළ යුතුය.) |

## 03. දිවිනැගුම ප්‍රජා මූල බැංකු වෙත මුදල් නිදහස් කිරීම.

3.1 ප්‍රතිලාභී ගිණුම් බැර කිරීම පිණිස දිවිනැගුම ප්‍රජා මූල බැංකු වෙත මුදල් නිදහස් කළ යුත්තේ ඔබ විසින් මාසිකව යාවත්කාලීන කරනු ලබන නාම ලේඛනය පදනම් කරගෙනය.

3.2 දිවිනැගුම ප්‍රතිලාභී නාම ලේඛන පිටපත් දෙකකින් සකස් කර එහි එක් පිටපතක් සමඟ අදාළ චෙක්පත දිවිනැගුම ප්‍රජාමූල බැංකුව වෙත සෑම මසකම පළමු සතිය තුළ යැවිය යුතුය.

3.3 සෑම මාසයක් සඳහාම දිවිනැගුම ප්‍රජා මූල බැංකුව වෙත මුදල් නිදහස් කිරීමට ප්‍රථම ඊට පෙර මාසයේ ප්‍රතිලාභී ගිණුම්වලට මුදල් ගිණුම්ගත කිරීම හා එසේ කිරීමට නොහැකි වූ ප්‍රතිලාභීන් පිළිබඳ වාර්තාවක් අදාළ මාසයේ 12 වන දිනට පෙර ප්‍රාදේශීය ලේකම් විසින් ලබාගෙන, එසේ ගිණුම්ගත නොකළ ඉතිරි මුදල් ප්‍රමාණය ප්‍රධාන කාර්යාලය වෙත සෑම මාසයකම 15 දිනට පෙර ලබාදිය යුතුය.

3.4 2015 වර්ෂයේ සිට සෑම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරයෙකු විසින්ම සහනාධාර සඳහා වන අක්මුදල් මාසයේ පළමු සතිය තුළ නිදහස් කරන බැවින් අක්මුදල් ලැබුණු විගස ගෙවීම් කිරීම සඳහා අදාළ මාසයේ මුදල් අවශ්‍යතා කල් වේලා ඇතිව දිස්ත්‍රික් ගණකාධිකාරී වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

සහනාධාර සඳහා වෙන්කරන අක්මුදල් එම කටයුත්ත සඳහා පමණක් යොදාගෙන අදාළ ගෙවීම් නිසි පරිදි අවසන් කිරීම සියලු දෙනාගේම වගකීම බව අවධාරණය කරමි.

## 04. සහනාධාර ගිණුම්ගත කිරීම.

4.1 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභියා නමින් දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ ගිණුමක් තිබීම අනිවාර්ය වේ. ගිණුමක් නොමැති නම් නව ගිණුමක් ප්‍රතිලාභියා හෝ කලත්‍රයා වෙනුවෙන් ආරම්භ කළ යුතුය.

4.2 ප්‍රතිලාභී නාම ලේඛනයට අනුව දිවිනැගුම ප්‍රජාමූල බැංකුව වෙත ලැබෙන මුදල් ඉතා කඩිනමින් ඔවුන්ගේ ගිණුම්වලට ගිණුම් ගතකර අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

4.3 බැංකු මගින් මුදල් ගෙවනු ලබන සෑම විටම ප්‍රතිලාභියා විසින්ම පමණක් මෙම මුදල් ලබා ගන්නා බවට සහතික කරගත යුතු අතර, ඕනෑම අවස්ථාවක ඔවුන්ට තම ගිණුමෙන් මුදල් ලබා ගැනීමට හැකි විය යුතුය. කලත්‍රයා වෙත මුදල් ලබා දීම යෝග්‍ය යැයි ප්‍රාදේශීය ලේකම් විසින් තීරණය කරනු ලබන විශේෂ අවස්ථාවක දී ඔහුගේ අවසර පත්‍රයක් යටතේ එම මුදල මුදා හැරීම සිදු කළ හැක.

4.4 සෑම ප්‍රතිලාභියෙකු වෙනුවෙන්ම ප්‍රජාමූල බැංකුවේ ගිණුමක් තිබිය යුතු අතර, එම ගිණුම මගින් සියලුම මුදල් ගිණුම්ගත කළ යුතුය.

4.5 ප්‍රතිලාභී නාම ලේඛන සංශෝධනය කිරීමේදී ප්‍රතිලාභ නිදහස් කිරීමත් සමඟ පළමු ගෙවීමේදී අදාළ බැංකු ගිණුම් පිළිබඳ විස්තර වාර්තාවක් දිවිනැගුම කළමනාකරු විසින් ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දිය යුතුය. එහි පිටපතක් දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත ද පිටපතක් සහිතව මා වෙත ලබා දිය යුතුය.

4.6 අනිවාර්ය ඉතිරි කිරීම් සම්බන්ධයෙන් වැඩි දුරටත් පහත සඳහන් ආකාරයෙන් කටයුතු කළ යුතුය. එනම්, ප්‍රතිලාභියා වෙත එම මුදල් නිදහස් කළ හැක්කේ, ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ඇතිව පහත සඳහන් අවශ්‍යතා මත පමණි.

- වයෝවෘද්ධ වූ විට (වයස අවුරුදු 60ට වැඩි වූ විට)
- හදිසි රෝගාබාධ අවස්ථාවන්වලදී වියදම් දන්වා අවශ්‍ය වියදම ලබා ගැනීමට, (ප්‍රතිලාභියා හෝ කලත්‍රයා හෝ දරුවෙකු)
- දරුවෙකුගේ උසස් අධ්‍යාපන කටයුත්තකට ගෙවීම් කිරීමට හා
- දිවි නැගුම ව්‍යාපෘති වෙනුවෙන් ආයෝජන අවශ්‍යතාවයක් ඉටුකර ගැනීමට

## 05. අක්මුදල් නිදහස් කිරීම.

5.1 සහනාධාර දීමනා ගෙවීම සඳහා අවශ්‍ය අක්මුදල් දිස්ත්‍රික් උපරිමය පදනම් කර ගනිමින් ප්‍රධාන කාර්යාලය විසින් දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත සෘජුවම ප්‍රේෂණය කරනු ලැබේ. දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් මුදල් ලැබුණු වහාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල උපරිම වාර්තා පදනම් කර ගනිමින් අවශ්‍ය අක්මුදල් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම්ගේ ගිණුම වෙත නිදහස් කරනු ඇත.

**06.** මෙම වැඩසටහන පිළිබඳව හා එය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව මේ සඳහා සුදුසුකම් ලැබූ සියලුම ප්‍රතිලාභීන්ව විධිමත් පරිදි නිරන්තරයෙන් දැනුවත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දිවිනැගුම සංවර්ධන නිලධාරීන් වෙත ලබා දිය යුතුය. එමෙන්ම, එම නිලධාරීන් විසින් අවශ්‍ය පරිදි ප්‍රතිලාභියා දැනුවත් කර ඇත්ද යන්නත් ගිණුම් විවෘත කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ මැදිහත්වීම ප්‍රමාණවත් පරිදි ලබා දෙන්නේද යන්නත් ඔබගේ විශේෂ අවධානයට ලක්විය යුතුය. විශේෂයෙන් ප්‍රතිලාභීන් අපහසුතාවයට පත් නොවන පරිදි කටයුතු කිරීමට, නිලධාරීන් වගබලා ගත යුතුය.

## 07. වාර්තා සකස් කිරීම.

| | ක්‍රියාකාරකම | ක්‍රියාත්මක කළයුතු නිලධාරින් | ක්‍රියාත්මක කළයුතු දින වකවානු |
|---|---|---|---|
| 01 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් දිවිනැගුම සහනාධාර දීමනා බැංකු උපරිම වාර්තාව පිළියෙල කිරීම(ඇමුණුම 01) | ප්‍රාදේශීය ලේකම් | සෑම මාසයකම වාර්තාව 05 දිනට පෙර දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ හා ප්‍රධාන කාර්යාලය වෙත ලබාදිය යුතුය. |
| 02 | දිස්ත්‍රික් මට්ටමේ සහනාධාර උපරිම වාර්තාව පිළියෙල කිරීම (ඇමුණුම02) | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | සෑම මාසයකම වාර්තාව 10 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබාදිය යුතුය. |
| 04 | මාසික සමස්ත උපරිම වාර්තා පදනම් කරගෙන දිස්ත්‍රික් කාර්යාල වෙත මුදල් නිදහස් කිරීම | ප්‍රධාන ගණකාධිකාරී | සෑම මාසයකම වියදම් සඳහා අවශ්‍ය මුදල් මාසයේ 01 දිනට ලබාදිය යුතුය. |
| 05 | දිස්ත්‍රික් කාර්යාලය විසින් ප්‍රාදේශීය කාර්යාල මට්ටමේ ගිණුම්වලට මුදල් නිදහස් කිරීම | දිස්ත්‍රික් ගණකාධිකාරි | සෑම මාසයකම මුදල මාසයේ 02 දිනට පෙර ලබාදිය යුතුය |
| 06 | සහනාධාර ගෙවීම් (බැංකු සඳහා චෙක්පත් නිකුත් කිරීම) | ප්‍රාදේශීය ලේකම් | සෑම මසකම 05 දිනට ප්‍රථම ලබා දිය යුතුය. |
| 07 | සහනාධාර ගෙවීම් (ප්‍රතිලාභීන්ගේ ගිණුම්වල මුදල් තැන්පත් කිරීම) | දිවිනැගුම බැංකු කළමනාකරු | සෑම මාසයකම මුදල එම මාසයේ පළමු සතිය තුළ තැන්පත් කළ යුතුය |
| 09 | සහනාධාර මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ගෙවීමේ ප්‍රගතිය (ඇමුණුම 03) | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | සෑම මාසයකම වාර්තාව එම මාසයේ 10 දිනට පෙර ප්‍රධාන කාර්යාලයේ සුභසාධන අංශය වෙත ලබාදිය යුතුය |
| 10 | සහනාධාර මුදල් ප්‍රතිලාභීන් වෙත ගෙවීමේ මාසික ප්‍රගතිය (ඇමුණුම 04) | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | සෑම මාසයකම වාර්තාව එම මාසයේ 15 දිනට පෙර ප්‍රධාන කාර්යාලයේ සුභසාධන අංශය ලබාදිය යුතුය |

08. 2015 අප්‍රේල් මස සිට සෑම මසකම පළමු සතිය තුළ සහනාධාර ගෙවීමට කටයුතු කර ඇති බැවින් ඉහත සඳහන් උපදෙස් පරිදි ක්‍රියා කර දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ සියලුම මුදල් නියමිත දින වකවානුවල ලබාදීම සඳහා ඔබේ කාරුණික අවධානය යොමු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

09. මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබ ලබා දෙන සහයෝගය ඉතා අගය කරමි.

එච්.සුමනපාල,

අධ්‍යක්ෂ ජනරාල්,

01. පිටපත් ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය - කරු.දැ.පි.
02. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කරු.දැ.පි.
03. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කරු.දැ.පි.
04. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලන පිළිබඳ අමාත්‍යාංශය - කරු.දැ.පි.
05. ලේකම්, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය - කරු.දැ.පි.
06. අයවැය අධ්‍යක්ෂ ජනරාල් - කරු.දැ.පි.
07. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කරු.දැ.පි.
08. දෙපාර්තමේන්තුවේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - කරු.දැ.පි. හා අ.ක.ස.

**ඇමුණුම අංක 01**

**දිවිනැගුම සහනාධාර දීමනා බැංකු උපරිම වාර්තාව.**

2015 ........................................................ මාසය

දිස්ත්‍රික්කය :-................................

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :-..........................................

දිවිනැගුම ප්‍රජාමූල බැංකුවේ නම :-.........................................

| වසමේ නම | අදාළ දීමනා වර්ගයට අයත් ප්‍රතිලාභීන් ගණන | | | | මුළු ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|
| | 4500/= | 3600/= | 2250/= | 630/= | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| එකතුව | | | | | |

ඉහත විස්තරය නිවැරදි බව සහතික කරමි.

සකස් කළේ :-......................................................

විෂය භාර නිලධාරී

වසම් උපරිමය අනුව ඉහත විස්තරය නිවැරදි බව සහතික කරමි.

පරීක්ෂා කළේ - ...........................................

නිවැරදි බවට සහතික කරමි

ප්‍රාදේශීය ලේකම් :- ..................................................

දිවිනැගු

**ම සහනාධාර දීමනා දිස්ත්‍රික් උපරිම වාර්තාව.**

2015 .......................................................... මාසය

දිස්ත්‍රික්කය :-.................................

| ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නම | දිවිනැගුම ප්‍රජාමූල බැංකුව | අදාළ දීමනා වර්ගයට අයත් ප්‍රතිලාභීන් ගණන | | | | මුලු ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | 4500/= | 3600/= | 2250/= | 630/= | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |

ඉහත විස්තරය නිවැරදි බව සහතික කරමි.

සකස් කළේ :-.......................................................

විෂය භාර නිලධාරී

වසම් උපරිමය අනුව ඉහත විස්තරය නිවැරදි බව සහතික කරමි.

පරීක්ෂා කළේ - ............................................

නිවැරදි බවට සහතික කරමි

දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ :- ..................................................

සකස් කළේ:-　　　　　　　　　පරීක්ෂා කළේ:-　　　　　　　　　නිවැරදි බවට සහතික කරමි.

දිවිනැගුම සහනාධාර මුදල් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ගෙවීමේ මාසික ප්‍රගතිය - දිස්ත්‍රික් වාර්තාව
2015........................මස අවසන් දිනට

දිස්ත්‍රික්කය :- ..............................

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දිස්ත්‍රික් ලේකම් කාර්යලයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කළ මුදල | | ශේෂය | |
|---|---|---|---|---|---|
| | | මුදල් තැන්පත් | අනිවාර්ය ඉතුරුම් තැන්පත් | මුදල් තැන්පත් | අනිවාර්ය ඉතුරුම් තැන්පත් |
| **උදා:-** | | | | | |
| 1 | මිල්ලනිය | xxxxxxx | xxxxxxx | xxxxxxx | xxxxxxx |
| | | | | | |
| | | | | | |
| | එකතුව | xxxxxxx | xxxxxxx | xxxxxxx | xxxxxxx |
| 2 | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | එකතුව | xxxxxxx | xxxxxxx | xxxxxxx | xxxxxxx |

................................　　　　　　　........................　　　　　　　.......................................

දිවිනැගුම සහනාධාර මුදල් ප්‍රතිලාභීන් වෙත ගෙවීමේ මාසික ප්‍රගතිය - දිස්ත්‍රික් වාර්තාව
2015........................අවසන් දිනට

දිස්ත්‍රික්කය :- ..............................

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | දිවිනැගුම ප්‍රජාමූල බැංකුව | ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ප්‍රජාමූල බැංකුව වෙත නිදහස් කළ මුදල | | දිවිනැගුම ප්‍රජාමූල බැංකු මගින් ප්‍රතිලාභී ගිණුම්වලට බැර කළ මුදල | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | මුදල් තැන්පත් | අනිවාර්ය ඉතුරුම් තැන්පත් | මුදල් තැන්පත් | අනිවාර්ය ඉතුරුම් තැන්පත් | මුදල් තැන්පත් | අනිවාර්ය ඉතුරුම් තැන්පත් |
| උදා:- | | | | | | | | |
| 1 | මිල්ලනිය | ගල්පාත | | | | | | |
| | | හල්තොට | | | | | | |
| | | මිල්ලනිය | | | | | | |
| | | එකතුව | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX |
| 2 | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | මුළු එකතුව | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX | XXXXXXX |

සකස් කළේ :-
.....................

පරීක්ෂා කළේ :-
........................

නිවැරදි බව සහතික කරමි.
................